# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2104/33 - 2019 ජනවාරි මස 04 වැනි සිකුරාදා - 2019.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියමය.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ
ක්‍රීඩා අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

32 සහ 33 වගන්ති යටතේ නියමය

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා එහි සංශෝධන අනුව 32(ආ) (33) වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා ක්‍රිකට් හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ශ්‍රී ලංකා ක්‍රිකට් හි පරිපාලනය හා වෙනත් යම් අවැසි කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය පවත්වන තෙක් යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 2018 දෙසැම්බර් මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වන වෙඩික්කාර ආරච්චිගේ චූලානන්ද පෙරේරා මහතාව නිසි බලධාරියා ලෙස මෙයින් පත් කරමි.

2018.10.26 දිනැති අංක 2094/37 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* 2018 දෙසැම්බර් මස 31 දින සිට මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

01 - 412


1A - PG 4345 — 512 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*